Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

විෂය:- නර්තනය

සතිය - 30

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

.අංග රචනය

- 01 සිට 10 තෙක් ප්‍රශ්ණ සියල්ලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න

1.වර්ණ හැඩතල උපයෝගී කරගෙන චරිතයට ගැලපෙන ආකාරයට හැඩගැන්වීම................................ වේ

(1) අංග රචනය (2) රංග රචනය

(3) පද රචනය (4) තිර රචනය

2. අංග රචනයේ දී එළිය සහ අඳුර මගින් මුහුණේ ..................ලක්ෂණ මතු කර දක්වයි

(1) වටකුරු (2) සිරස්

(3) තිරස් (4) ත්‍රිමාන

3. අංග රචනයේ ප්‍රභේදයක් වන්නේ

(1) ආහාර්ය අභිනය (2) චරිත නිරූපනය

(3) ශෛලිගත අංග රචනය (4) රංග රචනය

4.නර්තන ශිල්පියෙකු .........................කිරීමේ දි සමේ වර්ණය පිළිබඳ වඩාත් සැලකිලිමත් විය යුතුය

(1) ආහාර් අභිනය (2) චරිත නිරූපනය

(3) ශෛලිගත අංග රචනය (4) රංග රචනය

5.චරිතාංග අංග රචනයට පෙර අංග රචනා ශිල්පියා විසින් මනා අවබෝධයක් ලබා ගත යුතු වනුයේ

(1) වේදිකා අංග පිළිබඳවය (2) රංග රචනය පිළිබඳවය

(3) සමේ වර්ණය පිළිබඳවය (4)චරිතය පිළිබඳවය

6. අංග රචනා කරනු ලබන මුහුණේ ප්‍රධාන කොටස් ගණන වන්නේ

(1) 4කි (2) 3කි

(3) 6කි (4) 5කි

7. අංග රචනය අයත් වන්නේ සතර අභිනයෙන් කිනම් අභිනයකට ද?

(1) ආංගික (2) ආහාර්ය

(3) සාත්වික (4) වාචික

8. ආහාර්ය අභිනයට අයත් ප්‍රධාන කොටස් දෙක වන්නේ

(1) අංග රචනය හා රංග රචනය (2) රංග රචනය හා වෙස් මුහුණු පැළඳීම

(3) අංග රචනය හා වෙස් මෝස්තර රචනය(4) අංග රචනය හා රංග වින්‍යාසය

9.අංග රචනයේ දී භාවිතාකරන උපකරණයක් නොවන්නේ

(1)ආලේපන පැන්සල් (2) බුරුසු ස්පොන්ච්

(3) කෘතිම ඇස් පිහාටු (4) නළල් පටිය

10.වේදිකා නර්තන අංගයක් සඳහා නිරන්තරයෙන් භාවිතා කරනු ලබන අංග රචනය වනුයේ

(1)ශෛලිගත අංග රචනය (2) විකාරරූපී අංග රචනය

(3) චරිතාංග අංග රචනය (4) සරල අංග රචනය

* සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න

1. අංග රචනය යන්න හඳුන්වන්න
2. අංග රචනා විධි ක්‍රම නම් කරන්න
3. ඉන් දෙකක් පිළිබඳ විස්තර කරන්න
4. අංග රචනය කරනු ලබන මුහුණෙ ප්‍රධාන කොටස් නම් කරන්න
5. අංග රචනය සඳහා යොදා ගන්නා ආලේප 5ක් නම් කරන්න
6. නර්තන ශිල්පියෙකුට අංග රචනය අවශ්‍ය වන්නේ ඇයි
7. අංග රචනා ශිල්පියා සැලකිලිමත් විය යුතු කරුණු මොනවද
8. අංග රචනය කිරීමෙන් ශිල්පියාට ඇති ප්‍රයෝජන මොනවාද
9. නර්තනාංගයක් සඳහා අංග රචනය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද
10. චරිතාංග අංග රචනයක් සිදු කරන ආකාරය විස්තර කරන්න